

# ක්‍රිස්තුස් වහන්සේ එන්නේය.

## ඔහුගේ නැවත පැමිණීම ගැන බයිබල් ඉගැන්වීම

(Christ is Coming)

# ක්‍රිස්තුස් වහන්සේ එන්නේය.

## ඔහුගේ නැවත පැමිණීම ගැන බයිබල් ඉගැන්වීම

යේසුස් වහන්සේ කිසිදිනක පොලොවට නොඑන්නේ යයි ආගමික පිරිස් කියන්නට විම වරක් එක් මෝස්තරයක් විය. දැනටමත් බොහෝ උගත් ක්‍රිස්තියානීන් එය විශ්වාස කරති. නමුත් බොහෝ අනික් අය විශ්වාස කරන්නේ දෙවන පැමිණීම බොහෝ වැදගත් කරුණක් ලෙසයි.

ක්‍රිස්ටඩෙල්පියන් වරු නිතරම කියන්නේ යේසුස් වහන්සේගේ පොළොවට පැමිණීම දෙවියන් වහන්සේගේ අරමුණ සම්පූර්ණවීම සඳහා සජීවී බවයි. මේ පොතෙන් පැහැදිලි කරනු ලබන්නේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණෙන්නේ මක් නිසාද යනුය. මෙයින් තව දුරටත් ප්‍රකාශ කරනුයේ එතුමාගේ ආශ්වර්යමත් නැවත පැමිණීම සම්බන්ධ අදාළ සිද්ධින්ය.

## නව ගිවිසුමේ උගැන්වීම්

නව ගිවිසුමේ උගැන්වීම් මහත් සිදුවීම් ගැන නව ගිවිසුමේ සඳහන් කිරීම යම් කෙනෙක් ගනන් කර ඇත්තේ 318 වරක් ලෙසය. ඉදින් ඔබ උනන්දුවෙන් ගණන් කළහොත් ක්‍රිස්තියානි ප්‍රේමය ගැන සඳහන් වන්නේ 115 වරක් පමණි. එයින් ඔබ මේ සිද්ධාන්තයේ වැදගත්කම දකින්නට පටන් ගනු ඇත. යේසුස් වහන්සේගේ නැවත පැමිණීම ගැන නව ගිවිසුමේ ලේඛකයන් බොහෝ දෙනෙක් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත.

යේසුස් වහන්සේ නිතරම දේවරජය ගැනත් ඔහුගේ දෙවන පැමිණීම ගැනත් කථා කළේය. දේව රජ්‍ය වහාම ඇතිවන්නේ යැයි සිතූ අයට නිදසුන් වශයෙන් උපමා ද කියන ලදි. ඔහු විදේශයකට යාමටද එහි ගොස් රාජ්‍යයක් ලබා ආපසු ඒමටද තිබූ

ශ්‍රේෂ්ඨ මිනිසෙකු බඳු විය." (ලූක් 19:12) මනුෂ්‍ය පුත්‍රයා ආපසු ඒම ගැන ඔහු එක්වරකට වඩා කිවේය" (නිදසුන් මැතිව් 24:27 ,30,37,39,48,25:27:26:64).

ඔහු ඔහුගේ අනුගාමියකයන්ට ප්‍රකාශ කරන ලද්දේ ඔහුගේ ආත්මික සහ අදෘශමාන රැඳී සිටීම "ලෝකාන්තය දක්වාම බවය. (මේ වකවානුවේ අවසානය දක්වා) (මතෙව් 28:20) ඉන්පසු ඔහු අවසානයේදී ශාරීරිකව හා දෘශ්‍යමානව සදාකාලිකව රැඳී සිටීමට පැමිණෙන බව සහතික වෙන ලදී.

අපෝස්තුලුවරුන්ගේ සාක්ෂිය පැහැදිලි හා සමානය. උත්ථාන වූ ස්වාමීන් වහන්සේ විසින් ඔහු ස්වර්ගයට ඔසවා ගැනීමට පෙර සතලිස් දිනක් ඔවුන්ට පැහැදිලිව උගැන්වනු ලැබූහ. ඔවුනට දේව රාජ්‍ය ගැන උපදෙස් දෙන ලදහ. නැවත පිහිටුවා දෙනු ලැබූ ඊශ්‍රායල් රාජ්‍ය (ක්‍රියා 1:3-6 ) යන්න ඔහුගේ තනතුර පිළිබඳ ආරම්භක තේමාව විය. නැවත නැගිටීම පෙනේනනේ පැරණි ගිවිසුමේ සියළු පොරොන්දු ඔහු තුල ඒවායේ සම්පූර්ණත්වයට පැමිණීමය. (ලූක් 24:27) ඔහු ඔසවාගන්නා කාලයේ ඔලිව කන්දේ සිට වාලාකුලු අතරම ඔහු ඔසවා ගනු ලැබූ ලෙස දෙවියන් වහන්සේ එය විස්තර කිරීමට ඔහුගේ දේව දූතයින් එවීය.

"ගලිලයෝ මනුෂ්‍යයෙනි" ඔවුහු අපෝස්තුලුවරුනට කීහ. නුඹලා ස්වර්ගය දෙසට බලා සිටින්නේ ඇයි නුඹලා අතරෙන් ස්වර්ගයට ගනු ලැබූ මේ යේසුස් වහන්සේ නුඹලා ඔහු ස්වර්ගයටම යනු දුටු ලෙසින් ම ආපසු එන්නේය." (ක්‍රියා 1:11)

ඒ නිසා අපෝසතුලුවරු යෙරුසෙලමේ වීදි වල ඉගැන්වීමට පටන් ගැනීම පුදුමයක් නොවේ. ඔවුහු ඔවුන්ගේ ස්වාමි වූ යේසුස් වහන්සේ ආපසු රජු ලෙස පොළොවට එන බව කීහ. සොහොන යේසුස් වහන්සේ දරා සිටීමට නොහැකි වූ බව පේදුරු ඔහුගේ ප්‍රසිද්ධ කථාවේ දි කීහ. ඔහු ඔහුගේ ශ්‍රාවකයින්ට ගීතාවලිය සම්බන්ධය 110.1 ඔහුගේ ස්වාමීන්ද පාවිච්චි කළ බව ඔහුගේ

ස්වාමින්ගේ සතුරන් යටත් කරන තුරු ස්වර්ගයට යන බව කිය. ක්‍රියා (2:34,35) සහ පැරණි ගිවිසුමේ ආධිපත්‍යයෙන් යුත් යෙදුම් සලකා බලන්න.

නමුත් වැදගත් කාරණය සලකන්න. බයිබලය කිසිදිනක අපට ඵලඟට වන්වෙන් කුමක් ද යන්න දැනුම් දීමට උගන්වනවා නොවේ. එහි නිතරම ඇත්තේ ගැඹුරු අපේක්ෂාවක් වන අප පමණක් දැනුම ප්‍රයෝජනයට ගෙන ඵලඟ සිදුවීමට සූදානම් කිරීමට සාකච්ඡා කිරීමය.

එබැවින් නුඹලා විසින් කුරුසියෙහි ඇණ ගසනු ලැබූ මෙම යේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් ස්වාමින් වහන්සේද ක්‍රිස්තුස් වහන්සේ ද කළ බව ඊශ්‍රායල්ගේ මුලු වංශය නිසැකව දැනගැනීවයි කීවේය. නුඹලා සියල්ලෝම පසුතැවිලි පව් කමාව පිනිස යේසුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්මය ලබා පල්ලා (ක්‍රියා 2:36, 38)

එය අපේ බයිබල් ඉගැන්වීම් පිළිබඳ කල්පනාවෙන් අනුගමනය කළයුතු අතර ස්වාමි වූ යේසුස් වහන්සේගේ පැමිණීම පිළිබඳව සිතමින් අපේ හදවත් තුල පරීක්ෂා කිරීමට හේතු වේ.

## අනිකුත් නව ගිවිසුන් සටහන්

නව ගිවිසුමේ අනික් කතුවරුන් පිළිබඳ කුමක්ද? පාවුල් විසින් තෙසලොනිකයට ලියන ලද එක් නව ගිවිසුම් ලේඛණයක් අපි බලමු. ඔහු ස්වාමින් වහන්සේගේ පෞද්ගලික ආපසු ඒම පිළිබඳ සම්පූර්ණ පණිවිඩය පවසා ඇති සැටි කෙසේද?

"පැමිණෙන උදහසින් අප ගලවන්නෙමු. ඔහුගේ පුතුයේසුස් වහන්සේ ස්වර්ගයෙන් එනවා බලා සිටින පිණිස" (1:10)

"අපගේ බලාපොරොත්තුවත් ප්‍රීතියත් පාරට්ටුවේ ඔටුන්නත් කිමෙක්ද? අපගේ ස්වාමි වූ යේසුස් වහන්සේගේ ඊමේදී උන්වහන්සේ ඉදිරියෙහි නුඹලා නොවේද? (2:19)

"ඔහු නුඹලාගේ සිත් නිදොස්ව පිහිටුවා ඇත. අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔහුගේ සියළු සාන්තුවරු සමඟ එන විට" (3:13)

"ස්වාමීන් වහන්සේ මහත් ඝෝෂාවක් සමඟ ස්වර්ගයෙන් බසිනු ඇත." (4:16)

රාත්‍රියේ එනතුරු සොරෙකු මෙන් ස්වාමීන් වහන්සේගේ දිනය පැමිණෙන්නේය. (5:2)

නුඹලාගේ මුළු ආත්මයත් ප්‍රණයත් ශරීරයත් අපේ ස්වාමීන් වූ යේසුස් වහන්සේගේ පැමිණීමේ දී නිදොස්ව තිබෙන ලෙස පවිත්‍ර කරනු ලබාවා (5:23)

ඔබට මෙම පරීක්ෂණය වැඩිකර ගත හැක. ස්වාමීන් වහන්සෙගේ පැමිණීම පිළිබඳ නවගිවිසුම් ප්‍රකාශන නොකඩවා ඔබ කියවන්නට කැමති වනු ඇත. එය ප්‍රායෝගිකව ක්‍රිස්තියානි ජිවිතයට බලපානු ඇත. ස්වාමීන් වහන්සේ නැවත එන නිසා ඔවුන්ගේ ජිවිතවල සිදු වූ කාරණා හැඩගැස්වා ගත් ආකාරයකට අපද අපේ ජිවිත හැඩ ගස්වා ගත යුතුය.

## පැරණි ගිවිසුමේ ඉගැන්වීම්

නව ගිවිසුමේ සම්බන්ධයෙන් 318ක් සේ ගණන් කල පුද්ගලයාම පැරණි ගිවිසුම දක්වාම සිය පරීක්ෂණය ව්‍යාප්ත කරමින් සොයා ගනු ලැබුයේ එබඳු සම්බන්ධතාවයන් 1527 ක් මගින් ක්‍රිස්තුස් වහන්සේ රජු වශයෙන් දෙවියන් වහන්සේගේ අපේක්ෂාව සඳහා එන බව පැහැදිලි කරයි. සම්පූර්ණ පිරිසිදු සංඛ්‍යාව එතරම් වැදගත් නොවන බව පැහැදිලිය. අවස්ථාවන් සම්බන්ධ ඡේදවල සමහර වෙනස් උපදෙස් සඳහා ඉඩ ඇත. නමුත් සමහර විට සමහර

කියවන්නන් බයිබලයේ සමහර කොටස් වල දෙවන පැමිණීම පිළිබඳව පස් වරක් වත්බොහෝ සම්බන්ධයෙන් ගණනකට පෙර ඉමහත් ලෙස නොසලකා හැර ඇත.

මේ කරුණෙහි සත්‍ය මෙයයි. නවගිවිසුම තෙරුම් ගැනීමට පැරණි ගිවිසුව  කියවා තිබිය යුතුය. ගිවිසුම් දෙකම අයත් වන්නේ දෙවියන් වහන්සේගේ සත්‍ය එළිදරව් කිරීමේ ස්වභාවය එකට එක් කර පෙන්වීම සඳහාය. පැරණි ගිවිසුමේ කියන ලද අනාවැකි කොටසක් නව ගිවිසුමේ සම්පූර්ණ වුවද තවත් බොහෝ ප්‍රමාණයක් සම්පූර්ණ නොවී ඉතිරිව ඇත.

මේ පොරොන්දු වූ පොළොව මත දෙවියන් වහන්සේගේ රාජ්‍ය පාලනය කරන රජු පිළිබඳ පොරොන්දුව සම්පූර්ණ වී ඇද්දැයි ඔබෙන්ම අසන්න.

**උත්පත්ති :-**

"නුඹේ වංශය (ඒබ්‍රහම්ගෙන් පැවතෙන්නෙක්) තම සතුරන්ගේ දොරටුව හිමි කර ගන්නේය. නුඹේ වංශය නිසා පොළොවේ සියලු ජාතීහු ආශිර්වාද ලබන්නෝය."

(22:17-18 ක්‍රියා 3:25 බලන්න. ගලති 3:16)

**2 සැමුවෙල්**

"නුඹේ(දාවිත්ගේ) දවස් සම්පූර්ණ වී පියවරුන් සමඟ නිදන කල්හි මම නුඹෙන් පැවතෙන නුඹේ බීජය (පැවතෙන්න්) නුඹට පසුව පිහිටුවා ඔහුගේ රජකම ස්ථිර කරන්නෙමි. ඔහු මාගේ නාමයට ගෘහයක් තනන්නේය. ඔහුගේ රජකමේ සිංහාසනය සදාකාලේටම ස්ථිර කරන්නෙමි."(7:12-13)

**ගීතාවලි**

"ස්වාමීන් වහන්සේ මට කී සේක. නුඹ මාගේ පුත්‍රයා අද දින මම නුඹ ඒකජාත වූ වෙහිය. මගෙන් අසන්න. සකිල ජාතීහු නුඹට උරුමය වශයෙන් දෙන්නෙමි"

පොලොවේ මහත් ප්‍රදේශයක් ඔබට අයිතිකර දෙමි" (2:7,8 ක්‍රියා 4:25, 26 බලන්න)

"ඔහු (පොරොන්දු රජු) සාගරාන්තයක් දක්වා පාලනය කරන්නේය" ගංගා සීමා වන් සිට පොලොවේ කෙළවර දක්වා ද පාලනය කරන්නේය. " (72:6,8)

**යෙසායා**

"අන්තිම දිනවලදී ස්වාමීන් වහන්සේගේගෘහය (ඔහුගේ දෙවොල) පිහිටන කන්ද යෙරුසලම ළඟ කන්ද මුදුනේ පිහිටවුනු ලබන්නේය. සියළු ජාතීන් එහි යන්නෝය. ව්‍යවස්ථාව සියොන්හි සිට පැතිරෙන්නේය. ස්වාමීන් වහන්සේගේ වචනය යෙරුසෙලමෙන් වන්නේය. ඔහු ජාතීන් අතර විනිශ්චය කරන්නේය." (2:2,4)

"ඔහුගේ රාජ්‍යයේ පැතිරීම හා සාමයේ අවසානයක් නැත්තේය. මෙතැන්සිට සදා කාලයටම දාවිත්ගේ සිංහාසනය මත ඔහුගේ රාජ්‍ය විනිශ්චයන් කිරීමට යුක්තිය පිහිටුවීමද වන්නේය." (9:7)

**යෙරමියා**

"මෙන්න දවස් එන්නේය. ස්වාමීන් වහන්සේ කියන ලද සේක. මට දාවිත්ට ධාර්මික වූ ශාඛාවක් (පැවතෙන්නක්) නැගිටු වන්නෙමි. යුක්ති සහගතව විනිශ්චයෙන් පාලනය කරන රජෙකු පාලනය කෙරේ. ඔහුගේ දිනවලදී යුදා ගලවනු ලැබේ. ඊශ්‍රායල් අරක්ෂා සහිතව මෙසේ එමනිසා ඔහුට "අපගේ ධර්මපාධ ස්වාමීන් වහන්සේ " යන නම කියනු ලැබේ." (23:5, 6)

## දෙවියන් වහන්සේගේ රාජ්‍ය

මහපොළොව දෙවියන් වහන්සේ විසින් පාලනය කරනු ලබන බව බොහෝ වාර ගණනක් දෙවියන් වහන්සේ පොරොන්දු වී

ඇත. මිනිසාට කාලයන්හි ලබා ගැනීමට නොහැකි වූ දෙය දෙවියන් වහන්සේ විසින් පිහිටවනු ලැබේ. රජ වනාහි ආබ්‍රහම්ගේ ද දාවිත්ගේ ද වංශයෙන් පැවතෙන්නෙකි. (මතෙව් 1:1 බලන්න.) ඔහු යෙරුසෙලමේ දාවිත්ගේ සිංහාසනය මත පාලනය කරන්නේය. (ලූක් 1:31-33) ඔහුගේ රාජ්‍යය යුක්ති සහගත ධාර්මික එකක් වන්නේය. එහි දිව්‍යමය අධ්‍යාපනයක් දේවමාලිගයේ වන්දනාව රාජකීය බලයෙන් පිහිටුවා සාමය ක්‍රියාත්මක වේ. (එලිදරව් 11:15-18 බලන්න.)

පෙර එක් වරක් දේව රාජ්‍ය පොළව මත පිහිටුවා තිබිණ. දාවිත් රජු හා ඔහුගේ පැවතෙන්නන් දේව රාජ්‍යයේ සිංහාසනය මත පාලනය කලේය. (1 වංශාවලි 28:5) සිංහාසනය පිළිබඳ විශේෂයක් නැත්තේය. දේව නීතිය රජෙක්ගෙන් පසු තවත් රජෙක් නොසලකා හැරීම දේව නියම කරුණක් විය ඔහු එය අවසන් කිරීමට කටයුතු යෙදිය එහෙත් එසකියෙල් දිවැසි වරයා පවා එය කියන්නේ යෙදකියා රජුගේ රාජ්‍යයය අවසානයේදී දෙවියන් වහන්සේ එය අයත් නියම උරුම කාරයාට එය දෙන බවට පොරොන්දු විය. (එසකියෙල් 21: 25-27)

යේසුස් වහන්සේගේ පොළොව මත දෙවන වර පැමිණීමේදී පැරණි ගිවිසුමේ බල සම්පන්න පරිසරයට එකඟ බව තේරුම් ගත යුතුය. දේව රාජ්‍ය ආසන්න බව ප්‍රසිද්ධියේ කියමින් යේසුස් වහන්සේ තම සේවාව පටන්ගත් කල්හි (මාක් 1:15) පැරණි ගිවිසුමේ පොරොන්දු රජු ඔහු බව විස්වාස කල අයට උන්වහන්සේ කී සේක. නමුත් පළමුව යේසුස් වහන්සේ පෞද්ගලිකව ධර්මපාඨ බවට පත්විය යුතුව තිබිණ. අන් අයට දෙවියන් වහන්සේ සමඟ නිවැරදි වීමට හැකි බවට පත් කල යුතු විය.

දැන් අපට දෙවියන් වහන්සේ සමඟ සාමයට හැකිවේන අතර යේසුස් වහන්සේගේ ගලවා ගැනීමේ ක්‍රියාවලිය සමඟ එක් වී අපගේ පව් සමාවද ලැබිය හැක. පළමුව අප සුභාරංචිය අවබෝධ කල යුතුය. එයට යේසුස් වහන්සේ පෞද්ගලිකව හඳුනාගත යුතු

අතර උන් වහන්සේ රජ කරන රාජ්‍ය පිළිබඳ බයිබල් උගැන්වීම්ද අවබෝධ කරගත යුතුය. අනතුරුව අප විශ්වාසි වැඩිහිටියන් සේ උන්වහන්සේගේ ගැලවුම්කාර නාමයට බෞතිස්ම විය යුතුය. (ක්‍රියා 8:12)

## මෙන්න ඔබේ රජු

නමුත් ස්වාමීන් වහන්සේගේ දෙවන පැමිණීම කුමක් වැනි වේද? නිදසුනක් වශයෙන් එය සහ මුලින්ම නොවන්නට පුළුවන්ද? යේසුස් වහන්සේ පෞද්ගලිකව එහි සිටිද, නැතහොත් ආත්මික වශයෙන් පෙනිසිටිනවාද? ඔහු පොලොවට එන්නේද, නැතිනම් පොළොව දෙසට එන්නේ ද?

යේසුස් වහන්සේ සිරුරින්ම සොහොනෙන් නැගී සිටිසේක. උන් වහන්සේ අදෘශ්‍යමාන ආත්මතයක් නොව අතින් ඇල්ලිය හැකි දැකිය හැකි පුද්ගලයෙකි. (1යොහාන් 1:1 ලූක් 24:39, 40) උන් වහන්සේගේ සිරුරේ කුරුසිය මත දිවිපිදීම දී සිදුවූ සලකුණු ඇත්තේය. නමුත් තව දුරටත් උන්වහන්සේ මිනිස් ස්වභාවයේ සීමා සහිත පුද්ගලයෙකු නොවේ. ඔහුට වැසූ දොරවල් තුලින් යාමට හැකි විය. ඔහු ඔලිව කන්දේදී සිරුර පිටින්ම ස්වර්ගයට වැඩි සේක. උන් වහන්සේ ගුරුත්ව බලය පරදවා ගිය සේක. අනුගාමිකයෝ උන් වහන්සේ ස්වර්ගයට ඔසවාගනු දුටහ. ඔහු දෘශ්‍යමානව ආපසු එන්නේය. පසුව දේව දූතයින් විසින් කියන ලදුයේ "බලව ඔහු වලාකුළු වලින් එන්නේය. සියළු ඇස් ඔහු එනු ලබනු දකින්නේ ය" (එළිදරව් 1:7) පැරණි ගිවිසුමේ ප්‍රොපේත සොකරියා අනාවැකි කියමින් කුරුසියේ ඇණ ගැසීමට බොහෝ කලකට පෙර "ඔවුනු ඔවුන් විසින් පීඩා කරන ලද මා දෙස ශෝකයෙන් බලන්නෝය."(12:10)

එනිසා විශ්වසයෙන් යුතුව ස්වාමීන් වහන්සේ දෙස බලන්නවුන් පමණක් දකී යන්න කීමට ඉඩක් නැත. සමහරු බලා

දැක ශෝක වන්නේය. (එළිදරව් 1:7) යේසුස වහන්සෙ අදෘශ්‍යමානව එන්නේය යන්නටද ඉඩක් නොමැත්තේ උන් වහන්සේ මෙසේ අවවාද කර ඇති හෙයිනි.

"එදින කිසි මිනිසෙක් මෙන්න උන්වහන්සේ මෙහිය නැතිනම් එතැනය යියි කියන්නේද එය විශ්වාස නොකරන්න. මක් නිසාද බොරු ක්‍රිස්තුවරුන් හා බොරු ප්‍රොපේතවරුන් ඇති වන්නේය. (මතෙව් 24:23, 24)

බයිබලය කියන ස්වාමීන් වහන්සේ අනාගත පැමිණීම ඉදිරියේ යන්න ගැන වාදයක් නොමැත්තේණී එය අදෘශ්‍යමාන නොවන්නකි. නව ගිවිසුමේද ස්වාමීන් වහන්සේ එළිදරව්වීම පිළිබඳ කථා කරන්නේ නිරාවරණය හෝ පෙනී සිටීම යන අර්ථකින් ඇති වචන යොදා ගනිමින් කියයි. ඇත්තෙන්ම පෙනී සිටීම (ග්‍රීක් පැරොසියා) යන්න විශේෂයෙන්ම සුදුසු යෙදීමකි. එඩාත් ප්‍රබල ග්‍රීක් අකාරදියක මේ වචන කියා ඇත.

"එය නිල වශයෙන් උසස් පුද්ගලයෙකුගේ පැමිණීම වෙනුවෙන්" විශේෂයෙන් රජුන් හෝ අධි රාජයන් ප්‍රදේශයක් බැලීමට පැමිණීම වෙනුවෙන්" (ආන්ට් හා ගින්ග්‍රීක්)

එය ශුද්ධ ලියවිලිවල කියන එබඳු රජකුගේ පැමිණීමක්ය. සේනාව යේසුස් රජු යෙරුසෙලමට බූරුවකු පිට නැගී යන විට ඔවුහු කබා සහ පාම් අතු ඔහු ඉදිරියට විසි කලහ. දෙවියන් වහන්සේගේ පොරොන්දු වලට සම්බන්ධව ආචාරයක් සඳහනක් කරමින් කෑගැසුහ. "ස්වාමීන් වහන්සේගෙ නාමයෙන් අපගේ පිය වු දාවිත්ගේ රාජ්‍යයට පැමිණෙන්නා ආශිර්වාද වේ. (මාක් 11:10) මතෙව් සඳහන් කරමින් ප්‍රීතිය කල් ඇතිව විඳිමින් සෙකරියා ප්‍රොපේත තැන විසින් කියන ලද්ද ලියන්නේ "මෙන්න ඔබේ රජු ඔබ වෙත එන්නේය." යනුවෙනි.

එය රාජකීය පැමිණීමක ආරම්භය ඇතුලත් සතුට හා ප්‍රීතිය විය. ඊලඟ දෙය කුමක් වැනිදැයි කල්පනා කරන්න. ප්‍රෝපේතවරු එය ප්‍රකාශ කර ඇත.

"සියොන් දියණිය" බොහෝ සෙයින් ප්‍රීතිවෙන්න යෙරසෙලම් දියණියනි ශබ්ද පවත්වන්න බලව නුඹේ රජ නුඹ වෙත එන සේක. උන් වහනසේ ධර්මපාධය ගැලවීම ඇත්තාය. උන් වහන්සේ යටහත්ය. උන් වහන්සේගේ ආණ්ඩුව මුහුදෙන් මුහුදටත් ගංගාවේ පටන් පොළොවේ සීමාවන් දක්වාත් වන්නේය." (සෙකරියා 9: 9-10)

## දෙවැදෑරුම් සම්පූර්ණත්ව

මේ ශුද්ධ ලියවිලි ප්‍රකාශන බයිබලයේ බොහෝසෙයින් යෙදූ අනාවැකි පැහැදිලිව පෙනේ. එය කෙටි හා දීර්ඝව විස්තර වශයෙන් යේසුස් වහන්සේ රජු වශයෙන් පැමිණීමේ දි යෙරු සෙලම ප්‍රීතිවන අයුරු කොටලුවකු පිට නැගී රජෙකු මෙන් ප්‍රොපේත වරයා විසින් කියන ලද පරිදි පැමිණෙන්නේය. එහි සතුට කෙටි වන්නේය. එදා ඔහු ලෝ පතල සාමයක් ස්ථාපිත කිරීමට නොගියේය. (යෙරුසෙලමට සදාකාල රාජ්‍යයක් පාලනය කිරීමද නොයන්නේය. යේසුස් වහන්සේ ඒ අවස්ථාවේ දි සම්පූර්ණ කිරීමට ගියේ අනාගතයේදි පැහැදිලි ලෙසට එන්නාවූ රජ උන් වහන්සේ" අනාවැකි ස්ථිර කිරීමය.) ඔහු අපට පෘතුවිය වෙනස්කර පොරොන්දු සම්පූර්ණ කිරීමට ආපසු එන බවට අපට දුන් විශ්වාසය සම්පූර්ණ කරන්නේය.

සොකරියා අපට පැහැදිලි කරන්නේ එබඳු පැමිණීමේ අවස්ථා දෙක අතර විවේක කාලයක් නොමැති බවය. මෙනිසා සමහර අය කියන්නේ රාජ්‍ය කිසිදිනක නොපැමිණේය කියාය. ඔවුන් එසේ කියන්නේ යේසුස් වහන්සේ පිළිගත්තේ එය පළමු සියවසේ එන්නේය කියාය. නැතහොත් ඉතා කෙටිකලකට පසුව වන්නේය. කියාය. මෙය ප්‍රථම ක්‍රිස්තියානි බලාපොරොත්තුවක් ලෙස ඔවුන් ප්‍රතික්ෂේප කරන ලදි. මෙය දෙවැනි සියලූ ශුද්ධ ලියවිලි පරීක්ෂාකාරීව ඉගෙනීමෙන් පැහැදිලි වන්නේ යේසුස් වහන්සේගේ දෙවැනි පැමිණීම ඔසවා ගනු ලැබ වහාම සිදු නොවන බවයි.

## දිනය හා වේලාව

යේසුස් වහන්සේගේ පැමිණීම පිළිබඳ වේලාව උන්වහන්සේට වැරදුණේයැයි කීමට දරණ සියලු උත්සාහයන් නිෂ්ඵල වන්නේය. ඔහු එක්වරක් නොව පැහැදිලි ලෙස කීවේ ඔහු නොදන්නා බවය.

ඒ දිනය හා වේලාව කිසි මිනිසෙකු දන්නේ නැත. ස්වර්ගයේ දේව දූතයන් පවා දන්නේ නැත. එය මාගේ පියාණන් පමණක් දනී. (මතෙව් 24:36)

ඔහු පසුව කී ලෙස මෙය පියා පමණක් උන්වහනසේගේ ආධිපත්‍ය කියා දන්නේය. (ක්‍රියා 1:7) නමුත් යේසුස් වහන්සේ දැන සිටියේ උන්වහන්සේගේ දෙවන පැමිණීම අතර දිර්ඝ කාලයක් වන බවය. ඔහුගේ පැමිණීම වහාම සිදු නොවන බව පෙන්වීමට උන් වහන්සේ උපමා කී සේක. (ලූක් 19:11) බලාපොරොත්තුව සිටින්නට එය එක්තරා ප්‍රමාදයක් වනු ඇත. (මතෙව් 25:3,19) උන් වහන්සේ මෙන් ඔහුගේ අනුගාමිකයන් පවා ඔහු එන වේලාව නොදන්නෝය.

අපොස්තලුවරුද ප්‍රකාශකලේ ඔවුන් බලාපොරොත්තුව සිටින මහත් අවස්ථාව සිදුවන වේලාව හරියටම කීමට නොදන්නා බවය. බොහෝ අය මෙන් ආගමික දේට ගරහන්නනට පේදුරු අවවාද කලේ ඔවුන්ගේ විශ්වාස නැතිකම ගැන ඇත්තෙන්ම ඔහු ඔවුන්ගේ අභක්තික භාවය ගැන අවවාවද කලේය. (2 පීටර් 3:4) ඔහු කීවේ සිය කැමැත්තෙන් නොදන්නා බවය. මිනිසුන් තමාට විශ්වාස කිරීමට අවශ්‍ය දෙය විස්වාස කරති. ඔවුහු නිසැක කරුණු පිළිබඳ නොසැලකිලිමත්ය. පාවුල්ට කිසි සැකයක් නොවුයෙන් ඔහු මෙසේ කියමින් වාර්තා කරයි.

“සහෝදරයන්” මා ඔබට ලියන්නේ ඔබලාට කාලය හා වේලාව අවශ්‍ය නොවේ. නුඹලා පැහැදිලිව දතයුත්තේ ස්වාමීන් වහන්සේ එන බවය.” ( 1තෙසලෝනික 5:1-2)

ඔබට ඒ බයිබල් කියමන සම්පූර්ණ කළ හැකිද, රජුගේ කල් ඇතිව පැමිණිම පිළිබඳ වැදගත් කරුණු දෙකක් කියන්නේ කුමක් දැයි සලකා බලන්න. පාවුලු කියන "වේලාවන්" හා "කාලයන්" සමානය විස්තර එහි ඇත. එය විශ්වාසීන්ට උපකාර වන්නකි" මේ කියමන තව දුරටත් කියන්නේ "ස්වාමින් වහන්සේගේ දිනය රාත්‍රියෙහි සොරෙකු මෙන් එන්නේය"

එය සිදුවන විට උන්වහන්සේගේ පැමිණීම හදිසියේ බලාපොරොත්තු රහිතව සිදු වේ. සොරුන්ගේ පහර දීම කිසිවෙකු බලාපොරොත්තු නොවේ.

ඔවුන් නිතරම ජයගන්නේ ජනයා අතරතුර නොසලකන බැවින. සොරකම සාර්ථක වීමට වේගවත් බවද, හේතුවේ. යේසුස් වහන්සේ (මතෙව් 24:43) පාවුල් (1 තෙසලෝනික 5:2) හා පේදුරු (2පේදුරු 3:10) සටහන් යෙදුයේ මේ වැදගත් කරුණ පැහැදිලි කිරීමටය. අප අපේ ආරක්ෂාව සලසා ගත යුතුය. කල්පනාකාරීව සූදානම්ව අවදිව සිටිය යුතුය. ස්වාමීන් වහන්සේ ඕනෑම වෙලාවක පැමිණිය හැක. අප බලාපොරොත්තු නොවන මොහොතක උන් වහන්සේ පැමිණෙන්නේය .

## වේලාව හා කාලය

යේසුස් වහන්සේ ඔහුගේ ආපසු පැමිණීමට පෙර සිදුවිය යුතු දේ විස්තර කලේ ඒ නිසා වෙනි. ඔහු ඉතා ඕනෑකමින් විස්තර කලේ කල්පනාකාරීවීම අවශ්‍ය බවත්ය. එක් දිනක් ඕලිව කන්දේ ඔහුගේ අනුගාමිකයන් සමඟ හිඳිමින් ඔහු පසුව ස්වර්ගයට ඔසවා ගනු ලැබ ස්ථානයේදී, ලෝකන්තිමයේදී, ඔහුගේ පැමිණීමට පෙර සිදු විය යුතුදේත් පිළිබඳ, සාමාන්‍ය පැහැදිලි කිරීමක් කලේය. (මතෙව් 24:3) මේ අනාවැකිය කාවදින සුළු අභියෝගයක් සේ අනාවැකි කියන්නේ යෙරුසෙලමේ වැටීමත් දෙව මාලිගාය විනාශ කිරීමත් දීර්ඝ කාලීන ලෝක සිදුවීම් ද වේ.

පෙර කියන ලද සිදුවීම් ලැයිස්තුවක් (මතෙව් 24 මාක් 13 ලූක් 24) යන සුභාරංචිය 3හි ඇති මුත් ඒවා පහත සඳහන් පරිදි අනාවැකි කරුණු වලින් කියා සිටින්නේ නොවේ.

1. බොරු ක්‍රිස්තයානි සභාවන් ඇතිවීම හා බොරු ක්‍රිස්තුවරු ඇතිවීම
2. සත්‍ය ක්‍රිස්තියානීන්ට පීඩා කිරීම
3. ජාතියක් ජාතියකට විරුද්ධව යුද්ධ කිරීම සහ අසත්‍ය කථා පැතිර වීම
4. භූමිකම්පා සගතය හා වසංගත ඇති වීම
5. යෙරුසෙලම හමුදාවක් විසින් වටලෑම
6. යුදෙව් ජාතිය විසිරී යාම
7. යෙරුසෙලම යුදෙව් නොවන්නන්ට අයත් වීම
8. දුක් පීඩා ඇතිවීම
9. හිරු සඳු හා තරු වල සලකුණු ඇතිවීම
10. අහසේ බලය සොලවනු ලැබීම

විශ්වාසකයින්ට බොරු ක්‍රිස්තියානි සභාවන් නැගිටීම හා වර්ධනය පිළිබඳව අවවාද කලායයැයි සලකා බලන්න. එය ස්වාමීන් වහන්සේගේ ප්‍රථම සැලකිල්ලට ගත් කරුණ විය. නව ගිවිසුම කාලයේ සිඝ්‍රව වර්ධනය වූ වැරදි ඉගැන්වීම් මගින් ඔහුගේ වචන සම්පූර්ණ විය. (තිදසුන් ක්‍රියා 20:29) මේ යුගයේ අවසානයේ ඉතිරිය සම්පූර්ණ වන්නේය. අසත්‍ය ක්‍රිස්තියානි විශ්වාසිකයන්ගෙන් වැඩි දෙනෙක් අතර ඉතිරිවන්නේ ඉතා සුළුතර ප්‍රමාණයක් වන සත්‍ය ක්‍රිස්තියානි විශ්වාසිකයන් ද ඉතිරි වේ.

## ක්‍රිස්තු විරෝධීන්

අපෝස්තුලු මේ වර්ධනය පිළිබඳ අවවාද කලහ. පාවුල් පැහැදිලි කලේ බොරු ක්‍රිස්තියානි සභාවන් ඇතිවීම පිළිබඳව

ස්වාමින් වහන්සේගේ දිනයේදී ඇතිවනන් පිළිබඳ අනාවැකි කිවේය.

"ඇදහිල්ලෙන් වැටී යාමත් විනාශයේ පුත්‍රයා වන පාපයේ මනුෂ්‍යයා එළිදරව්වීමත් පළමුවෙන්ම උනොත් මිස ඒක නොපැමිණෙන්නේය. ඔහු දෙවියන් වහන්සේයැයි කියනු ලැබ හොත් නමස්කාර කරනු ලැබූ සියල්ලන්ට විරුද්ධව සිට" (2 තෙසලෝනික 2:3 ,4)

අපෝස්තලු පාවුල්, දානියෙල් ප්‍රෙජේතවරයාගේ බසට සම්බන්ධ කරමින් පාපයේ මනුෂ්‍යයා හා මැදපෙරදිග ඇතිවන්නාවූ මහත් අධිරාජ්‍යයන් 4ක් ගැන කලින් කියනලද දේට සම්බන්ධ කෙරෙයි. ඔහු බොරු ශුද්ධ වූ රෝම අධිරාජ්‍යයක් මිත්‍යාවන් දැඩි ලෙස ඇතිවී එය ක්‍රිස්තුන් වහන්සේට හා උන්වහන්සේගේ සත්‍ය අනුගාමිකයින්ට විරුද්ධවන බව පෙන්වයි. මෙය ක්‍රිස්තියානින්ට පටහැනි වන අතර අපෝස්තලු එය "නොපත්කමේ අභිරහස" වශයෙන් පෙන්වයි. එය දැනටමත් ක්‍රියාත්මක අතර මහත් "මුළාවකි."

තව දුරටත් ස්වාමින් වහන්සේගේ අනාගත සිදුවීම් පිළිබඳ උගැන් වූ දෙය භාතිගෙන දෙන බව පෙන්වා දේ. එය ඇතුලාන්තයෙන්ද පිටස්තරයෙන්ද භූමිකම්පා සාගතය සන්නධ අරගල බිය හා භයානක දර්ශණ ස්වර්ගයේ වන්නේය.එය මහත් බියට හා ආපදාවන්ට හේතුවේ. පොළොව මත සිදුවන දේ නිසා ඇතිවන බියෙන් මිනිසුන් ගතයුතු මහ ඔවුහු නොදනිති.

එක්තරා ප්‍රමාණයකට මේ ප්‍රශ්ණ මිනිසා තරම්ම පැරණිය. එකිනෙකාට එරෙහි යුද්ධ කිරිමේ කැමැත්ත බයිබලයේ පළමු පොතේ සඳහන් සිදුවීමකි" එමෙන්ම සාගතය පිළිබඳ සිදුවීම්ද එසේමය. මිනිසාගේ දාමරිකම් ඉතා අශෝභන ලෙස ඉහළගොස් ඇත. එතැන් පටන් බොහෝ සෙයින් බිය කරු බව දක්නට ඇත. මිනිසාගේ අනාගතය පිළිබඳ බිය පලකරන බලයක් ද දක්නට ඇත. පෙර කිසිදිනක නොවූ ලෙස යේසුස් වහන්සේගේ මේ වචන සත්‍ය වී ඇත.

"එහිදී ඉර සඳ හා තාරකාවන් කෙරේ ලකුණු හා මුහුදෙන් රළ ගැසීමේ ඝෝෂාවන් නිසා වන විය වුලෙන් පොළොවේ ජාතින්ට දුක් වේදනා වන්නේය. මක් නිසාද ආකාශයේ පරාක්‍රම ධාරීන් සොලවනු ලබන බැවින් භයෙනුත් ලෝකයට පැමිණෙන්නාවූ දේ බලාපොරොත්තුව සිටීමෙනුත් සිත් ක්ලාන්ත වන්නේය. එකල මනුෂ්‍ය පුත්‍රයා බලයෙන් හා තේජසින් වලාකුල් වලින් එනවා ඔවුහු දකින්නේය." (ලූක් 21:25-27)

## පීඩාව

සාගරයද තරංගයන්හි බිය කරු හඬද සූර්යාගේ හා සඳුගේත් තාරකාවන්හි ද සලකුණු සඳහාත් කිරීමෙන් එක්තරා ක්‍රමයක ව්‍යවහාර්ථයෙන් හෝ නිදසුන් ක්‍රමයක් හෝ දෙකම විය හැක. නිදසුනක් වශයෙන් යෙසයාහි නපුරු මිනිසුන් "කැළඹුන සයුර මෙන්" දුෂ්ඨයාට නිශ්චලව සිටිය නොහැක. එය මඩ හා කුණු මතුකරයි. (57:20) එමෙන්ම යේසුස් වහන්සේ ද ලොකයේ මුළුමනින්ම කරදර ඇතිවීම එහි මුළුමනින්ම නපුරුකම සඳහන් කලා විය හැක. ඔහු අපට තවත් ලෞකික ක්‍රමයට ලෝකයේ නපුරුකම උගැන්වූවා විය හැක. මහ හඬින් රැව් දෙන සයුරු තරංග මෙන් යුගයේ අවසානයේදී ඇතිවන තත්වය විස්තර කලා විය යුතුය. ඇතිගයින්ම පසුගිය වසර කිහිපය තුල භූමිකම්පා හා ස්වාභාවික විපත් රැසක් ලොව පුරා සිදුවිය. (රෝම 8:22) එම අපොස්තලු පාවුල් විස්තර කරනුයේ මුළු ලෝකයේම ක්‍රමයක් නිසා මහත් වූ වේදනාකාරී පීඩාවන් ඇතිවන්නේය යනුවෙනි. එය ස්ත්‍රියකගේ ප්‍රසව වේදනාව මෙනි මේ අපගේ වර්තමාන පීඩාකාර වේදනාවන්ද වහාම පටන්ගන්නා අළුත් හා වඩා හොද ලොවක් වෙනුවෙන් දරණ ප්‍රසව වේදනාවකි.

ගිවිසුමේ දෙකිහිම මිනිස් ආණ්ඩු වල අවසානයේ යේසුස් වහන්සේගේ දෙවන පැමිණීම සිදුවන විට මේ පීඩාවන් ඇති වන බැව් සඳහන් කරයි.

"කිසිදිනක නොවූ අයුරු කරදර කාලයක්" (දානියෙල් 12:1)

යාකොබ්ගේ (ඊස්රායල්ගේ) කරදර කාලයේ (යෙරමියා 30:7) මහත් පීඩාවන්" (මතෙව් 24:21)

විශ්වාසීන් මේ කරදර වලින් පීඩාවට පත්වීමට හෝ ඉන් මිදීමට බලා සිටිය යුතුය. වර්තමාන විශ්වාසීන් මේ කරදර කාලය තුල ජීවත්ව සිටින්නාහුය. ඇත්තෙන්ම දැනටමත් ඔවුහු එසේ කරන්නෝය. යේසුස් වහන්සේ පොරොන්දු වූයේ තෝරාගත්තවුන් වෙනුවෙන් මේ කරදර කාලය කෙටි කරන බවයි. (මාක් 13:20) නමුත් අවසානයේ විනිසුරු ඉදිරියේ සිටින්නවුන් මහත් පීඩා තුලින් පැමිණෙන්නෝය. ඔවුහු තමන්ගේ සළු සෝදා ගන්නෙත් ඒවා බැටළුවාගේ ලෙයින් සුදු කරන්නෝය. (එළිදරව්ව 7:14)

කරදර වැඩිවන විට දෙවියන් වහන්සේගේ උදහස පොළොව මත වගුරවනු ලබන්නේයත සත්‍ය විස්වාසීන් එම වැගිරීමෙන් ආරක්ෂා වන බවට විස්තර කර ඇත. දේව උදහස ඇති වන විට මිනිස් සමාජයේ විශාල සෙලවීමක් ඇතිවන බව යෙසෙයා විස්තර කරයි.

"මාගේ ජනයිනි නුඹලාගේ රැකවරණය ස්ථානයට එන්න. මොහොතකට නුඹලා සැඟව සිටින්න මේ මහත් විනාශය අවසන් වනතුරු. මක් නිසාද, දෙවියන් වහන්සේ පොළොවේ වසන්නවුන්ට ඔවුන්ගේ වරදට දඬුවම් කිරීමට උන්වහන්සේගේ ස්ථානයෙන් පිටතට එන්නේය." (24:18-23:26:20-21)

ඒ නිසා අප ඉතා කල්පනා කාරීව යේසුස් වහන්සේ කීදෙය සැලකිය යුතුය.

මේදේවල් (උන්වහන්සේ කථාකල සලකුණු) සිදුවන්නට පටන් ගත් විට ඉහල බලන්නන. ඔබේ හිස් ඔසවන්න. ඔබේ ගැලවීම ආසන්නය. (ලූක් 21:28)

සහමුලින්ම විපත පැමිණෙනතුරු අප සිටිය යුතු නැත. එයින් ගැලවීමට මගක් ඉතිරිව නැත. දැන් පාඩමක් උගැනීම වඩා හොඳය. මේ යේසුස් වහන්සෙගේ දෙවන පැමිණීමට මොහොතකට පෙර අවස්ථාවය.

## සලකුණු වංශය

උන්වහන්සේගේ පැමිණීම හා සියළු සැකයන් දුරු කරන මහත් සලකුණක් ඇත්තේය. ඊශ්‍රායල් වංශය දෙවියනන් වහන්සේ විසින් පොරොන්දු වූ ලෙස නැවත ඔවුන්ගේ දේශය අත්කර ගනිමින් සිටිති. යුදෙව් වංශයේ ඉතිහාසය දෙවියන් වහන්සේ ඔවුන්ට දුන් පොරොන්දු අනුව උන්වහන්සේගේ බලාපොරොත්තුව අනුව සිදුවී ඇත. ඔවුහු විශේෂිත ජාතියක් යයි කියනු ලැබේ. ඒ අනුව ඔවුනගේ පියවරුන්ට දුන් මහත් වූ පොරොන්දුව නිසායය. ඔවුන්ට අද අප ඊශ්‍රායලය නමින් දන්නා දේශය හිමිකර ගැනීමට අයිතිය දෙන ලදි. ඔවුහු දෙවියන් වහන්සේගේ පොළොව මත පිහිටවූ රාජ්‍යයේ සිහසුනට හිමිකරුවෝය. ඔවුන් එසේ වන්නේ ඔවුන් දේව වචනය තුල ජීවත් වුවහොත් පමණය.

ඔවුහු බොහෝ සියවස් ගණනකට පසුව යේසුස් වහන්සේ තම ගැලවුම්කරු පිළිගැනීම ප්‍රතිෂේප කලා පමණක් නොව රෝමානුන් සමඟ එක්ව උන්වහන්සේ කුරුසියේ ඇණ ගැසීම පවා මහත්සේ උනන්දු වූ හෙයින් ඔවුහු මේ උරුමය අහිමි විය. මේ ප්‍රතික්ෂේප කිරීම නිසා යෙරුසෙලම පෙරලා දැමිණ. අතරමැද සියවස්ගණනක් යුදෙව්වරු රටක් නැති ජනතාවක් ලෙස පොළොවේ ඇවිද්දාහ. ඔවුහු ගිය සෑම තැනම හිංසාවට හා පිළිකුලට භාජනය වූහ. ශුද්ධ ලියවිලිවල කියා තිබූ පරිදි එසේ විය.

නමුත් ශුද්ධ ලියවිලි කලින් සඳහන් කර ඇත්තේ මේ ජාතියේ අනාගතය යහපත් බවය. ඒ ඔවුන් තමන්ගේ ක්‍රියාදාමයන් වෙනස් කරන නිසා නොව දෙවියන් වහන්සේ ඔවුනගේ ආදි මුතුන්

මිත්තන් ගැන අනුකම්පා කොට ඔවුන් ගලවා ගැනීමට යන පොරොන්දු ඔවුනට සිහිපත් කොට ඔහුගේ මහත් වූ නාමය නිර්දොස කිරීම වන නිසාය.

අවසන් කලට පෙර ඔවුහු ජාතීන් අතරින් ආපසු ගෙනවුත් නැවත වරක් ඔවුන්ගේම දේශයේ පදිංචි කරවා ප්‍රොපේතවරු කී ලෙස පොරොන්දු දේශයේ පදිංචි කරවයි.

**යෙසයා** :- ඉතිරිවන ටිකදෙනා ආපසු එන්නේය. දෙවියන්ගේ නිදහස්කර ගත්තවුන් ආපසු පැමිණ සියොන් වෙතට එයි. (10:21; 35:10)

**යෙරමියා** :- ඊශ්‍රායලය විසුරුවා හරිනු ලැබූහු ඔවුන් එක්කරන්නේය. (31:10)

**එසකියල්** :- මම නුඹලා ජනයා කෙරෙන් එකතු කරන්නෙමි. රටවල් වලින් නුඹලා එක්කරන්නෙමි. ඔවුහු තමන්ගේ දේශයේ වසන්නෝය. ඔවුහු විස්වාසයෙන් වාසය කරනන්නෝය. (11:17;28: 25-26)

**සෙකරියා** :- මම ඔවුන් නැවත ගෙන එන්නෙමි. ඔවුහු යෙරුසෙලම මැද පිවත් වන්නාහුය. (8:8)

මෙය මෙසේ විය. වසර 2 දහසකට පමණ පසු ඔවුන්ගේ වැටී පිරිහියාමෙන් පසු එක්සත් ජාතීන්ගේ අන කිරීමෙන් 1948 දි ඊශ්‍රායල් නැවත බිහිවිය. 1967 දි සම්පූර්ණ යෙරුසෙලම යුදෙව්වන් විසින් අයිති කරගන්නා ලදි.

යේසුස් වහන්සේගේ වචනය සම්පූර්ණ වීමට මේ සියලු කාලය ගතවිය.

"ඔවුහු කඩුවෙන් වැටෙන්නේය. සියලු ජාතීන් අතරට වහලුන් වශයෙන් ගෙනයනු ලබන්නෝය. යෙරුසෙලම අන්‍ය ජාතීන්

විසින් පොඩි කර දමනු ලබන්නේය. අන්‍ය ජාතීන්ගේ කාලය සම්පූර්ණ වනතුරු එසේ වන්නේය."(ලූක් 21:24)

සියලු දේවල් පෙන්නුම් කරන්නේ අන්‍යජාතීන්ගේ කාලය ඉක්මනින් ලබන බවත් නැවත වරක් දේව රාජ්‍ය ඇතිවන කාලය අත ළඟ බවත්ය. කරදර කාලය හා යුදෙව්වරු ආපසු දේශයට පැමිණීම කිසිදු සැකයක් නොතබයි. ඉක්මණින්ම යේසුස් රජු ලෝක පාලකයා ලෙස යෙරූසෙලමට එන්නේ ඊශ්‍රායල හා මුළු පොළොව පාලනය සඳහාය. යේසුස් වහන්සේ සහ ප්‍රොපේතවරුන් විසින් දෙන ලද පවතින සලකුණු සියල්ල වේ. ඊශ්‍රායලය පිහිටුවීම ජාතියේ සලකුණ අවසානය අතලඟ බවට පැහැදිලිම සාක්ෂිය වේ.

## අන්වේසක් වීම

යේසුස් වහන්සේගේ විශ්වාසී අනුගාමිකයන් බලා සිටින්නේ කුමක් සඳහාද? යේසුස් වහන්සේගේ ආපසු පැමිණීමේ දී උන් වහන්සේ සමඟ ස්වර්ගයට යාමට බලාපොරොත්තු විය හැකිදැරූ අපහසුය. ස්වාමින් වහන්සේ ආපසු එන් නැත, ස්වාමින් වහන්සේ පැමිණෙන්නේ පොලෝතලය යෙරූසෙලමේ සිට පාලනය කිරීමටය. සමහර සභාවන් යේසුස් වහනසේ දෙවතාවතක් පැමිණෙන බව පවසති. පළමු පැමිණීම විශ්වාසකියන්ව රහසිගතව ස්වර්ගයට රැස්කර ගැනීමටය. දෙවැනි පැමිණීම වනුයේ සේසුස් වහන්සේ සහ උන් වහන්සේගේ විශ්වාසකයින්ව ලෝකයේ ඉතිරි ජනගහනයට එලිදරව් වී මුළු ලොව පතල වූ විටය. මේ පැමිණීම අවස්ථාවන් දෙක අතර කාල පරතරය වෙනස් වේ. සමහර සභාවන් කියනුයේ එය ඉතා කෙටි කාල පරිච්ඡේදයක් යනුය. අනිත් සභාවන් කියනුයේ මේ පැමිණීමේ අවස්ථාවන් දෙක අවුරුදු හතක කාල පරිච්ඡේදයක් අතරතුර සිදුවිය හැකි බවය.

නැවත පැමිණීම අවස්ථාවන් දෙක පිළිබඳව බයිබලයේ සඳහන් කරනුයේ යේසුස් වහන්සේගේ නැවත පැමිණීවිට

විශ්වාසිකයින් සහ අවිශ්වාසිකයන් වෙන් කරනු ලබන බවය. 1තෙසලෝනික 4:16 සහ 17 අනුව යේසුස් වහන්සේගේ නැවත පැමිණීම ගැන වැදගත් තොරතුරු අපට පෙන් වාදී ඇත. විශ්වාසිකයන්ව රහසිතගතව ස්වර්ගයට එක්රැස් කර ගැනීමේ මතය විකාශ වී ඇත්තේ මේ පද දෙකේ ඇතුලත් තොරතුරු වල ප්‍රතිඵලයක් වශයෙනි. හඟවා ඇති අවුරුදු 7ක පීඩාව සම්බන්ධ වීමට හේතුවී අත්තේ සමහර බයිබල් ජේද වැරදි ලෙස අර්ථ නිරූපනය කිරීම හේතුවෙනි. විශේෂයෙන්ම එලිදරව් පොතේ සමහරකි.

ඇත්ත වශයෙන්ම ස්වාමින් වහන්සේ මුණ ගැසීමණී සඳහා ජිවත් ව සිටින විශ්වාසියන් හා මළවුන්ගෙන් නැගිටිවන ලද විශ්වාසිකයන්ව රැස්කර ගැනීමක් හෝ අල්වා නැගීමට සිදු වේ. මේ අවංක විශ්වාසිකයෝ මෙම සිද්ධියේදී පැමිණ සිටින දේව දූතයන් සමඟ සාක්ෂි දීමේ පිරිසක් ලෙස ප්‍රිය ජනක කණ්ඩායමක් සාදා ගනිවී. නමුත් යේසුස් වහන්සේ නැවත පොළෝතලයට පැමිණි විට ඔවුන් ඔහු මුණ ගැසීමට යයි. අප දැනටමත් ගෙන හැර පැන ලද බයිබල් ජේද වලත් ඔවුන්ගේ ඉලක්කය පැහැදිලි වී ඇත. යේසුස් ස්වාමින් ජෙරුසෙලමට යාවි. (සෙකරියා 14:4) "ජෙරුසෙලම මහ රජුගේ රාජධානිය වේ" (මතෙව් 5: 35)

## දෙවියන්වහන්සේ පැමිණෙයි

මෙ අවස්ථාවේ අහසේ බලයන් පවා සොලවනු ලැබ මිනිස් හදවත් බියෙන් සැලේ ජාතින් යෙරුසෙලම වටකොට යුද්ධයට පැමිණේ. එවිට බලාපොරොත්තු නොවූ ලෙස ස්වාමින් වහන්සේ එන්නේය. ඉතා හදිසියෙන් මහත් බලයකින් හා මහිමයෙන් විස්වාසීව සිටින්නන්ට ගැලවීම ගෙන තමන්ගේ ජිවිතවල් සූදානම් කර ඇති අයට ගැලවීම ගෙනේ නමුත් ස්වකීය ආශාවන් අනුව ගොස් විස්වාසි පොරොන්දුව හා දෙවියන් වහන්සේගේ කාරුණික ආරාධනය ඉවතලූවන්ට විනිශ්චය කෙරේ.

"ස්වාමීන් වහනසේ තමන්ගේ ශුද්ධවන්තයින් සමඟ මහිමය ලබන්ටත් අපේ සාක්ෂිය අදහාගත් සියල්ලන් තුල මවිත ලෙස පෙනෙන්ටත් එන කල්හි ඒ තැනැත්තෝ උන්වහනසේගේ අභිමුඛයෙන්ද, උන්වහන්සේගේ බලයේ තේජස ඉදිරියෙන්ද, සදාකාල විනාශයේ දඬුවම විඳින්නෝය." (2 තෙසලෝනික 1: 9-10)

අප බයිබලය පැහැදිලිව පොරොන්දු වන සජීව තත්වය විශ්වාස කරමු. අපට සාමන්‍යයෙන් "බලාසිටීම" කළ නොහැක. යේසුස් වහන්සේ එන්නේ දැනටමත් විශ්වාස කරන්නන් ගලවා අවිශ්වාසිකයන්ගේ ගැනීමටය. උන්වහන්සේ එන්නේ විශ්වසින්ගේ කරුණු ඇසිමටත් දෙවියන් වහන්සේගේ දේ පිළිබඳව තිසැක කරුණු දැන්වීමටත් නොවේ.

යේසුස් වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන් හට ඔහුගේ ආපසු ඒම පිළිබඳ කථා කරන විට ඔහු ඔවුන්ගේ උනන්දුව වඩාත් යොමු කලේ උන් වහන්සේගේ පැමිණීම හේතුවෙන් සිදුවන්නා වූ විපාකයන් ගැනය. අද දින අපට යේසුස් වහන්සේ එන්නේ කවදාද යන්න දැනගැනීමට නොහැක. නමුත් අප පැහැදිලිව පිරිසිදුව දන්නේ උන්වහන්සේ පැමිණි විට ඊට පෙර අපේ ජීවිත ගත කළ ආකාරය ගැන කරුණු අපෙන් අසන බවය.

"හොඳින් සිහිකරන්න....... නාමඟ නොයන්න........ කරදර නොවන්න........ තමන් ගැන සිහියෙන් සිටින්න........ සුභාරංචිය පතුරවන්න........ කලබල නොවන්න........ අවසානය දක්වා ඉවසන්න....... පලා යන්න........ යාඥාකරන්න........ බොරු අනාගත වාක්‍යයන් විශ්වාස නොකරන්න......... මතක තබා ගන්න......... ඉහල බලා ඔබේ හිස් ඔසවන්න......... සූදානම්ව සිටින්න. (මතෙව් 24; මාක් 13; ලූක් 21)

ස්වාමීන් වහන්සේගේ පැමිණීම ආසන්නබව පවසන අපොස්තුලු වරු ද මේ කරුණු පැහැදිලි කරයි.

"මේ සියල්ල මෙසේ නාස්තිවෙන්ට තිබෙන බැවින් නුඹලා දෙවියන් වහන්සේගේ දවස පැමිණීමට බලා හිඳිමින්, උන් වහන්සේගේ ඉදිරයේ කැලැල් රහිතව හිඳමින් නිදොස්ව සාමදානයෙන් දකිනු ලබන පිණිස"(2 පේදුරු 3:11-14)

"අභික්තික කමද, ලෞකික තෘෂ්ණාද, ඒපාකර අශිර්වාද ලත් බලාපොරොත්තුව ගැනත් මහොත්තම දෙවියන් වහන්සේගේ ද අපගේ ගැලවුම්කාර යේසුස් වහන්සේගේද තේජසේ ප්‍රකාශ වීම ගැනත් බලා හිඳිමින්" (තිටස් 2: 12-13)

"උන්වහනසේ ප්‍රකාශවුනාම අපි උන්වහන්සේ සමාන වන බව දනිමු. මක්නිසාද, උන්වහන්සේ සිටින ආකාරයටම අපි උන් වහන්සේ දකිමු. උන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තුව සිටින්නන් එසේම පිරිසිදු වන්නාහ"( 1 යොහාන් 3:2-3)

**ඔබ ගැන සිහිතබා ගන්න.**

බයිබලය වනාහි අනාගතයට අපගේ මග පෙන්නුම් කරන පොතය. දැනට එය අපගේ අත්පොත වශයෙන් පවති. එය අපට පෙන්වන්නේ දෙවියන් වහන්සේ අප කරනවාට කැමති දේය. එයින් අපට දෙවියන් වහන්සේගේ පොරොන්දු සත්‍ය බව උගත හැකිය. එයින් අපට දෙවියන් වහන්සේට කීකරු වීම ගැන හොඳින් දැන ගත හැක. බෞතිස්මයෙන් ආරම්භ කර යේසුස් වහනසේ අපට අණ කල දෙය කලා වන්නේය.

එන්නාහු දේව රාජ්‍යය මිනිස් අත්දැකිම වෙනස් කරන්නෝය. අපගේ මැවුම්කරු සමඟ සුහදව විසීමට අප උගත ගත යුතුය. ස්වාමින් වහන්සේ අත ළඟය. අපගේ ජිවිත පරීක්ෂා කර බැලීම අප සැමට ඇති හදිසි කරුණකි. එසේ අප සැම දෙනාම පැමිණෙන්නා වූ රජු වෙනුවෙන් සූදානම් විය හැක.

ටෙක් වීන් මෝගන්

ඉංග්‍රීසි මුල් පිටපතෙන් පරිවර්ථනය කරන ලද මෙය
සියලු හිමිකම් හිමි
"THE CHRISTADELPHIAN MAGAZINE AND PUBLISHING
ASSOCIATION (BIRMINGHAM, UK),
හි කාරුණික අවසරය මත මුද්‍රණය කරන
ලදී.